# කැලණිය විශ්වවිද්‍යාලය
# සමාජීය විද්‍යා පීඨය
# පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය

## තොරතුරු කළමනාකරණය හා තාක්ෂණය ඩිප්ලෝමා පාඨමාලාව - 2024

විද්වත් ඇඳුරුමඬුල්ලකගේ සහභාගීත්වයෙන් සිදුකරන ලද පාඨමාලා සංශෝධනයකින් පසු පසුගිය වසරේ නව මුහුණුවරකින් තොරතුරු කළමණාකරනය හා තාක්ෂණය පිළිබඳ මෙම පාඨමාලාව ආරම්භ කෙරුණි. එහි සාර්ථකත්වය මත 2024 වර්ෂය සඳහා අයදුම්පත් භාර ගැනීම දැන් අරඹා ඇත.

### • පාඨමාලා සංයුතිය

සේවාස්ථාන සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය, උපායශීලී තොරතුරු කළමනාකරණය සහ තොරතුරු කළමනාකරණ පද්ධති නිර්මාණය, තොරතුරු කළමනාකරණ ව්‍යාපාර හෝ ඊකියා සඳහා සංඛ්‍යාංකික දිවි පැවැත්ම, තොරතුරු සාක්ෂරතාවය හා අලෙවිකරණය, තොරතුරු සුරක්ෂණය හා ආචාර ධර්ම, වෙබ් පිටු නිර්මාණකරණය හා සංඛ්‍යාංකික මාධ්‍ය සන්නිවේදනය හා තාක්ෂණය

### • සුදුසුකම්

අ.පො.ස. (උ.පෙළ) අවම වශයෙන් විෂයන් 03 කින් සාමාර්ථය ලැබීම හෝ
කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව ඩිප්ලෝමා ප්‍රථම කොටස හදාරන/සමත්වීම හෝ
ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව ඩිප්ලෝමාවේ ප්‍රථම කොටස සමත් වීම හෝ කොළඹ විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා පිළිබඳ ජාතික ආයතනයේ තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමාවේ ප්‍රථම කොටස සමත් වීම හෝ කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගන්නා ලද වෙනත් සුදුසුකම්

මෙම ඩිප්ලෝමා පාඨමාලාව සඳහා බඳවා ගනු ලබන උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව වසරකට 100 කි.

### • කවුරුන් සඳහාද?

තොරතුරු සේවකයින් හෝ තොරතුරු කළමනාකරුවන් ලෙස කටයුතු කරනු ලබන අමාත්‍යාංශ නිලධාරීන්, ව්‍යවස්ථාපිත මණ්ඩල නිලධාරීන්, අධ්‍යාපනඥයින්, පුස්තකාලයාධිපතිවරුන්, පර්යේෂණ මධ්‍යස්ථාන හෝ සංස්කෘතික මධ්‍යස්ථාන නිලධාරීන්, විද්‍යුත් තොරතුරු මධ්‍යස්ථාන නිලධාරීන් හා කළමනාකරුවන් (නෞණසල මධ්‍යස්ථාන, මාධ්‍ය ආයතන, විකාශන මධ්‍යස්ථාන, පොත් ප්‍රකාශකයින්, ලේඛනාරක්ෂක නිලධාරීන්) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වෘත්තිකයින්, ජාතික හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන තොරතුරු නිලධාරීන් හෝ තොරතුරු කළමනාකරුවන්, කථිකාචාර්යවරුන්, ගුරුවරුන්. උපදේශකවරුන්, පුස්තකාල කාර්යමණ්ඩල සාමාජිකයන්, පරිගණක දත්ත ප්‍රවේශකයින්, රූ රටා නිර්මාණකරුවන්, මධ්‍යම මට්ටමේ කාර්මික ශිල්පීන්, මුද්‍රණ ක්ෂේත්‍රයේ නියුතු වන්නන් සහ පසල් හැරගිය සිසුන්

- **කාල සීමාව** - එක් අවුරුදු පාඨමාලාවකි. (සති අන්ත දේශන)
- **මාධ්‍ය** - සිංහල සහ ඉංග්‍රීසි
- **පාඨමාලා ගාස්තුව** - ඉල්ලුම් පත්‍ර, ලියාපදිංචි ගාස්තු සහ විභාග ගාස්තු ඇතුලත්ව රු. 50,000/- කි.

මෙම ගාස්තුව වාරික තුනකින් ගෙවිය හැකිය. ප්‍රථම වාරිකය රු. 25,000 කි. දෙවන වාරිකය රු. 15,000 ක් වන අතර පාඨමාලාව ආරම්භ කර පළමු මාස 04 ඇතුලත ගෙවිය යුතු වේ. තෙවන වාරිකය රු. 10,000 ක් වන අතර දෙවන වාරිකයෙන් පසු ඉදිරි මාස තුනක් තුළ ගෙවිය යුතු වේ.

### • අයදුම් කිරීම

කැලණිය මහජන බැංකුවේ අංක **055-1001-10667549** දරණ ගිණුමට රු.**750.00** ක් බැර කරන ලද ලදුපතක් පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය වෙත 2024.10.28 සිට 2024.11.20 දින දක්වා පැමිණ ලදුපත ඉදිරිපත් කිරීමෙන් අයදුම්පත සහ විස්තර පත්‍රිකාව ලබා ගත හැකිය. තවද, පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශයේ වෙබ් පිටුවෙන් අයදුම්පත ලබාගත හැකි අතර සම්පූර්ණ කළ අයදුම්පත සමග ගෙවන ලද ලදුපතේ පිටපත තැපැල් මගින් අධ්‍යයන අංශය වෙත පහත පරිදි එවිය යුතු වේ.

තැපෑලෙන් අයදුම්පත ලබා ලබාගැනීම සඳහා බැංකු ලදුපත සමග අයදුම්කරුගේ නම හා ලිපිනය ලියන ලද මුද්දර ඇලවූ 9X4 ප්‍රමාණයේ ලියුම් කවරයක් **පාඨමාලා සම්බන්ධීකාරක, තොරතුරු කළමනාකරණ හා තාක්ෂණය ඩිප්ලෝමා පාඨමාලාව, පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය** ලිපිනයට එවිය යුතුය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2024.11.30 දින හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එමෙන්ම කවරයේ ඉහළ වම් කෙළවරේ **තොරතුරු කළමනාකරණය හා තාක්ෂණය ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ලියාපදිංචි වීම 2024** යනුවෙන් සඳහන් කරන්න.

වැඩිදුර විස්තර : පාඨමාලා සම්බන්ධීකාරක, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නදීකා රත්නබාහු - 0768084694
වෙබ් පිටුව: http://ss.kln.ac.lk/depts/libinfoscience/